8401

AL/2016/54/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
## கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
## General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය I<br>கீழைத்தேய சங்கீதம் I<br>Oriental Music I | 54 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

විභාග අංකය : ...............................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 07 | |
| 02 | 08 - 19 | |
| 03 | 20 - 34 | |
| 04 | 35 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**
※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- ප්‍රශ්න අංක **1** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** පොදුවේ මේලයක් සඳහා වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.
(1) පිළිවෙළින් ආරෝහණ ස්වර 7ක් යෙදීම
(2) පිළිවෙළින් ශුද්ධ ස්වර 7ක් යෙදීම
(3) පිළිවෙළින් ආරෝහණ හා අවරෝහණ ස්වර 7ක් යෙදීම
(4) පිළිවෙළින් ප්‍රකෘති හා විකෘති ස්වර 7ක් යෙදීම
(5) පිළිවෙළින් සප්තක තුනට ම අයත් ස්වර 7ක් යෙදීම (......)

**2.** සෑම ස්වරයකට ම තත් කිහිපය බැගින් සුසර කරනු ලබන තත් රාශියකින් යුත් භාරතීය සංගීත භාණ්ඩය කුමක් ද?
(1) තාම්පුරාව (2) සන්තූරය (3) සිතාරය
(4) වීණාව (5) දිල්රුබාව (......)

**3.** සිතාරයේ ප්‍රධාන තත විවෘත ව වාදනය කළ විට හඬ නැගෙන ස්වරය වන්නේ,
(1) මන්ද්‍ර පංචමයයි. (2) මන්ද්‍ර ෂඩ්ජයයි. (3) මන්ද්‍ර මධ්‍යමයයි.
(4) මධ්‍ය ෂඩ්ජයයි. (5) මධ්‍ය මධ්‍යමයයි. (......)

**4.** පණ්ඩිත් භිම්සෙන් ජෝසි වඩාත් ම ප්‍රසිද්ධියට පත් ව ඇති ගායන ශෛලිය කුමක් ද?
(1) ගසල් (2) ධ්‍රැපද් (3) කව්වාලි
(4) ඛයාල් (5) චතුරංග (......)

**5.** සමප්‍රකෘති රාග යුගලයක් සඳහන් පිළිතුර කුමක් ද?
(1) බාගේශ්‍රී - මාල්කෞන්ස් (2) භෛරව - කාලිංගඩා (3) බිහාග් - බහාර්
(4) බ්‍රින්දාබනී සාරංග - දේස් (5) භීම්පලාසි - ජයජයවන්ති (......)

**6.** 'ඛන්' ස්වරයක් සංකේතවත් වන පිළිතුර තෝරන්න.
(1) ස⌒ම (2) ධ ධ ප ම ප (3) ( ම ) (4) $^{නි}$ධ (5) රි (......)

**7.** පහත කරුණු අතුරෙන් ගායන සමය සම්බන්ධයෙන් මධ්‍යම ස්වරය පිළිබඳ ව **වැරදි** කියමන කුමක් ද?
(1) උදය සන්ධි ප්‍රකාශ රාගයන්හි මධ්‍යමය ශුද්ධ වේ.
(2) සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ රාගයන්හි මධ්‍යමය තීව්‍ර වේ.
(3) සන්ධි ප්‍රකාශ රාගසමය තීරණයට මධ්‍යම ස්වරය හේතුවක් වේ.
(4) මධ්‍යම ස්වරය 'අද්ව දර්ශක' ස්වරය ලෙස හැඳින්වේ.
(5) සන්ධි ප්‍රකාශ රාගයක් ලෙස තීරණය කිරීම සඳහා මධ්‍යම ස්වරය පමණක් සැලකීම ප්‍රමාණවත් වේ. (......)

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

8. දේස් රාගයෙහි 'ග' සහ 'ධ' යන ස්වර දෙක ඉවත් කළ විට ඉතිරි ස්වරවලින් පිළිබිඹු වන රාගය කුමක් ද?
(1) බ්‍රින්දාබනී සාරංග (2) ජයජයවන්ති (3) ජෞනපුරි
(4) තිලක්කාමෝද් (5) බිහාග් (......)

9. ජයජයවන්ති රාගය සඳහා නිවැරදි ව ගැළපෙන තානාලංකාරය තෝරන්න.
(1) රිගු මප ධප මගු රිගු රිස නිස ධනි (2) රිග මප ධප මග රිගු රිස නිස ධනි
(3) රිග මප ධප මගු රිග රිස නිස ධනි (4) රිග මප ධප මග රිග රිස නිස ධනි
(5) රිගු මප ධප මගු රිගු රිස නිස ධනි (......)

10. "රි ම ප ධ ම ප සං, ප ධ ම ග" යන ස්වර මාලාවෙන් ප්‍රකාශ වන රාගය තෝරන්න.
(1) ජෞනපුරි (2) දේස්
(3) බ්‍රින්දාබනී සාරංග (4) තිලක්කාමෝද්
(5) ජයජයවන්ති (......)

11. ජෞනපුරි රාගයට අදාළ නිවැරදි කියමන තෝරන්න.
(1) එහි වාදි සහ සංවාදි ස්වර 'ධු' සහ 'ගු' යන්න ය.
(2) එහි මේලය භෛරවී යන්න ය.
(3) ම ප ධු ධු සං නි ධු ප යන ස්වර කොටසින් නිවැරදි ව ආරෝහණ-අවරෝහණ ලක්ෂණ මතු වීම ය.
(4) එය ඖඩව සම්පූර්ණ ජාති රාගයක් වීම ය.
(5) එහි ගායන සමය දිවා ප්‍රථම ප්‍රහරය වීම ය. (......)

12. 'ම' සහ 'ස' යන ස්වර දෙක වාදි සහ සංවාදි වශයෙන් යොදා ගන්නා රාග **තුන** කුමක් ද?
(1) බාගේශ්‍රී, මාල්කෞන්ස්, බහාර් (2) බහාර්, බිහාග්, මාල්කෞන්ස්
(3) භීම්පලාසි, බාගේශ්‍රී, බිහාග් (4) හමීර්, මාල්කෞන්ස්, භීම්පලාසි
(5) බාගේශ්‍රී, බහාර්, හමීර් (......)

13. බාගේශ්‍රී රාගයේ ජාතිය පිළිබඳ පවත්නා මත තුන සඳහන් වන්නේ කෙසේ ද?

| | | | |
|---|---|---|---|
| (1) | ඖඩව | ඖඩව - ෂාඩව | ෂාඩව - සම්පූර්ණ |
| (2) | ඖඩව - ෂාඩව | ෂාඩව - සම්පූර්ණ | සම්පූර්ණ |
| (3) | ෂාඩව | ඖඩව - ෂාඩව | සම්පූර්ණ |
| (4) | ඖඩව - ෂාඩව | ඖඩව - සම්පූර්ණ | සම්පූර්ණ |
| (5) | ඖඩව | ෂාඩව | සම්පූර්ණ |

(......)

14. නි ස ගු ම ගු රි ස, නි ස ගු ම ප ම ගු රි ස වශයෙන් යෙදෙන භීම්පලාසි රාගයට අයත් ස්වර අභ්‍යාසය සඳහා සුදුසු ඊළඟ ස්වර ඛණ්ඩය තෝරන්න.
(1) නි ස ගු ම ප නි සං නි ධ ප ම ගු රි ස (2) නි ස ගු ම ප ධ නි ධ ප ම ගු රි ස
(3) නි ස ගු ම ප ධ නි සං නි ධ ප ම ගු රි ස (4) නි ස ගු ම ප සං නි ධ ප ම ගු රි ස
(5) නි ස ගු ම ප නි ධ ප ම ගු රි ස (......)

15. 'ඉපිද එ බෝසත් නා ලොව වාරෙක' යනුවෙන් ඇරඹෙන වන්නම සඳහා භාවිත වන අවනද්ධ භාණ්ඩය කුමක් ද?
(1) යක් බෙරය (2) මෘදංගය (3) මද්දලය (4) ගැට බෙරය (5) දවුල (......)

16. ශ්‍රී ලාංකේය රාජ සභා සංගීතය සමග වඩාත් වැදගත් තැනක් ගන්නා 'සරස්වතී මණ්ඩපය' පැවතියේ,
(1) අනුරාධපුර යුගයේ දී ය. (2) පොළොන්නරු යුගයේ දී ය.
(3) දඹදෙණි යුගයේ දී ය. (4) කෝට්ටේ යුගයේ දී ය.
(5) මහනුවර යුගයේ දී ය. (......)

17. තුරඟා වන්නම කුමන තිත් තාලයකට අයත් වේ ද?
(1) සුළු මැදුම් දෙතිත (2) මහ තනි තිත
(3) දෙසුළු මැදුම් තුන්තිත (4) මැදුම් මහ දෙතිත
(5) සුළු මහ දෙතිත (......)

18. 'රූ රැසේ අඳිනා ලෙසේ අත්' කවි පාද කොටස තුළ ඇතුළත් ලඝු-ගුරු මාත්‍රා සංඛ්‍යාව පිළිවෙළින් දක්වන්න.
(1) 3 – 5 (2) 4 – 4 (3) 4 – 5 (4) 5 – 4 (5) 6 – 4 (......)

19. 'රන් රසා සේම වඩන' යන ගී පාද ඛණ්ඩයෙහි ඇතුළත් සඳැස් මත් හා ගී මත් සංඛ්‍යා පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.
(1) 8 හා 11 (2) 10 හා 12 (3) 11 හා 12 (4) 11 හා 14 (5) 12 හා 16 (......)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**20.** පහත සඳහන් ගී වර්ග අතුරෙන් මුළුමනින් ම අනාඝාතාත්මක ගී වර්ග ඇතුළත් ගී සමුච්චය තෝරන්න.

(1) පාරු ගී, පතල් ගී, ටීකා සී පද
(2) පතල් ගී, පැල් ගී, ගොයම් ගී
(3) පාරු ගී, පැල් ගී, ගැල් ගී
(4) පතල් ගී, බඹර ගී, කෙළි ගී
(5) පතල් ගී, පාරු ගී, පැල් ගී (......)


**21.** අපරදිග සංගීතය අනුව 'C' Minor ස්කේලයට අයත් ස්වර හත පෙළගස්වන්නේ කෙසේ ද?

(1) C D $E^b$ F G $A^b$ $B^b$
(2) $C^\#$ D E $F^\#$ G $A^\#$ B
(3) C D $E^b$ F G A B
(4) C D E $F^\#$ G A B
(5) C D E $F^\#$ G $A^b$ B (......)

**22.** සිම්පල් ඩුපල් (simple duple) හා සිම්පල් කොඩ්‍රුපල් (simple quadruple) යනුවෙන් අපරදිග සංගීතය තුළ

(1) හඬ තල දෙකක් හැඳින්වේ.
(2) තාල රිද්ම දෙකක් හැඳින්වේ.
(3) ස්වර ප්‍රභේද දෙකක් හැඳින්වේ.
(4) ලය ප්‍රභේද දෙකක් හැඳින්වේ.
(5) ස්වර සප්තක දෙකක් හැඳින්වේ. (......)

- අංක **23** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ස්වර පුවරු රූප සටහන උපයෝගි කර ගන්න.




**23.** ස්වර පුවරුවේ 1 - 6 - 9 - 13 යන අංක හිමි ස්වර සතර එක වර හැඬ වූ විට නිකුත් වන කෝඩ් (chord) එක කුමක් ද?

(1) F - Major (2) F - Minor (3) C - Major (4) C - Minor (5) G - Major (......)

**24.** අපරදිග සංගීතයේ රේඛා මණ්ඩලයට (Staff) අයත් රේඛා පහ මත පිහිටා ඇති ස්වර පහ පිළිවෙළින් අංකනය කරනුයේ කෙසේ ද?

(1) 3 - 6 -10 - 13 - 16
(2) 4 - 7 - 11 - 14 - 17
(3) 5 - 8 - 12 - 15 - 18
(4) 6 - 9 - 13 - 16 - 19
(5) 7 - 10 - 14 - 17 - 20 (......)

**25.** ආසාවරි මේලයට අයත් ස්වර අංක පිළිවෙළින් දක්වන්නේ කෙසේ ද?

(1) 1 - 2 - 3 - 4 - 6 - 7 - 10
(2) 1 - 3 - 4 - 6 - 8 - 9 - 11
(3) 1 - 3 - 5 - 6 - 8 - 10 - 12
(4) 1 - 3 - 5 - 7 - 9 - 10 - 12
(5) 1 - 4 - 5 - 7 - 9 - 10 - 13 (......)

- අංක **26** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ස්වර ප්‍රස්තාරය උපයෝගි කර ගන්න.

| ගම ධනි ධප | නිධ ස්නි ධනි ධප | ම්ප ධප ධම් | පධ ම්ප ගම රිස |

**26.** ඉහත තානාලංකාරයෙන් පිළිබිඹු වන රාගය නම් කරන්න. ........................................

**27.** එම රාගයෙහි යෙදෙන විවාදි ස්වරය නම් කරන්න. ........................................

**28.** එම රාගය අයත් මේලයේ ස්වර පිළිවෙළින් ලියා දක්වන්න. ........................................

**29.** ඉහත තානාලංකාර වර්ගය නම් කරන්න. ........................................

**30.** ගාන්ධාරය සහ පංචමයට අමතර ව ඉහත තානාලංකාරයේ යෙදෙන ඉතිරි වක්‍ර ස්වරය නම් කරන්න. ..................

- අංක **31** සිට **34** තෙක් හිස්තැන් පිරවීම සඳහා පහත ඡේදය උපයෝගී කරගන්න.

මහේෂි විසින් උසස් පෙළ විභාගයට නිර්දේශිත රාගයක් ගායකී ක්‍රමයට වාදනයේ යෙදුණේ හිමාෂ විසින් වාදනය කළ තාලයකට අනුව ය. ඇය සිය සංගීත භාණ්ඩයේ තත් දෙකක් උපයෝගි කර ගනිමින් තාලයෙහි බලි ස්ථානයෙන් මප නිස් නිධ පධ මග රි වශයෙන් මුඛඩාව ආරම්භකර සමස්ථානයට පැමිණියා ය.

මහේෂි වැයූ සංගීත භාණ්ඩය **(31)** .................................... යි. ඇය වැයූ රාගය **(32)** .................................... වන අතර, ඉහත ස්වර මාලාව වැයිය හැකි තවත් රාගයකි **(33)** .................................... රාගය. හිමාෂ වැයුවේ **(34)** .................................... තාලයයි.

[ හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- අංක **35** සිට **37** තෙක් හිස්තැන් පිරවීම සඳහා පහත වගුවෙහි විස්තර අදාළ කර ගන්න.

| A | B | C |
|---|---|---|
| • නිෂාදය ශුද්ධ ව පමණක් යෙදේ.<br>• ශුද්ධ නිෂාදය පංචමයට පසුව යෙදේ. | • නිෂාදය ශුද්ධ ව හා කෝමල ව යෙදේ.<br>• කෝමල නිෂාදයට පසුව පංචමය යෙදේ. | • නිෂාදය කෝමල ව පමණක් යෙදේ.<br>• කෝමල නිෂාදය පංචමයට පසුව යෙදේ. |

ඉහත **A** තීරුවට අදාළ රාගය **(35)** .................................... රාගය වන අතර, **B** තීරුවට අදාළ රාග දෙකක් වන්නේ බ්‍රින්දාබනී සාරංග රාගය සහ **(36)** .................................... රාගයයි. **C** තීරුවට අදාළ රාගය වන්නේ **(37)** .................................... රාගයයි.

- අංක **38** සිට **42** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

**38.** සූනියම් යාගය පහතරට ශාන්තිකර්මවලට අයත් වන අතර කඩවර කවි අයත් වන්නේ කුමන ශාන්තිකර්ම වර්ගයට ද?
..........................................................................................................................

**39.** අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය තුළ ග්ලොකන්ස්පීල් (Glokenspiel) සහ සයිලෆෝන් (Xylophone) යන සංගීත භාණ්ඩ දෙක අයත් වන්නේ කුමන භාණ්ඩ වර්ගයට ද? ..........................................................

**40.** පැස්ටෝරල් (Pastoral) No: 6 සිම්ෆනිය කිනම් සංගීතඥයෙකුගේ නිර්මාණයක් ද? ..........................................

**41.** 'දොං | ජිංත | ගත | දොංත' වශයෙන් යෙදෙන දේශීය තාල රූපයට අදාළ තාල සංකේත පිළිවෙළින් ලියා දක්වන්න.
..........................................................................................................................

**42.** ඍග්, යජුර්, අථර්වන් යන වේදයන්ට අමතර වශයෙන් සංගීත කලාව හා බැඳි වේදය නම් කරන්න. ..............................

- අංක **43** සිට **50** තෙක් ප්‍රශ්න සඳහා දී ඇති එක් එක් වගන්තියේ හිස්තැන්වලට වඩාත් සුදුසු වචනය/වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

**43.** චීන සංගීතය ප්‍රාරම්භක යුගය, ........................................ යුගය, ජාතික යුගය සහ .................................... යුගය ලෙස යුග හතරකට බෙදේ.

**44.** උච්ච ෂඩ්ජයේ කම්පන සංඛ්‍යාතය 512 Hz ක් නම්, මධ්‍ය ෂඩ්ජයේ සහ මධ්‍ය පංචමයේ කම්පන සංඛ්‍යාත වන්නේ පිළිවෙළින් ..................... හා ..................... ය.

**45.** මෙරට ප්‍රථම වර්ණ චිත්‍රපටිය වූ 'රන් මුතු දූව' .................................... සූරීන්ගේ සංගීත නිර්මාණයෙන් ද, 'අශෝකමාලා' චිත්‍රපටය .................................... සූරීන්ගේ සංගීත නිර්මාණයෙන් ද රසවත් වී ඇත.

**46.** කර්ණාටක මූලික තාල 35 ගොඩනැගීම සඳහා පාදක වී ඇති ප්‍රධාන තාල සංඛ්‍යාව .......................... ක් වන අතර ජාති සංඛ්‍යාව .......................... කි.

**47.** සරල ශාස්ත්‍රීය ගීත ලෙස සැලකෙන 'හෝ පලු වන පෙත' ගීතය ............................ රාගය ඇසුරෙන් ද, 'හංස රාජිණී' ගීතය ............................ රාගය ඇසුරෙන් ද නිර්මාණය වී ඇත.

**48.** 'ලෝනා මුණි රාජගේ' ගීතය ඇතුළත් නූර්තිය .................................... වන අතර, එහි නිෂ්පාදකවරයා වනුයේ ................................................ සූරීන් ය.

**49.** 'දූලා නෙතුපුලා' ගීය .................................... නාටකයේ ඇතුළත් වන අතර, 'රතදර සිරියා පරදන' ගීතය .................................... නාටකයේ ඇතුළත් වේ.

**50.** 'සිනිඳු සුදු මුදු තලාවේ' ගීතය .................................... තාලය සහ .................................... තාලය යොදා ගනිමින් නිර්මාණය වී ඇත.

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

8397

AL/2016/54/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය II<br>கீழைத்தேய சங்கீதம் II<br>Oriental Music II | 54 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

✻ **I** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, **II** කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග **හතරකට** අයත් ස්වර සංගතීන් ය.

(a) ධ නි ස ම, ම ගු, ම ගු රි ස

(b) ස නි ස ම, ප ගු, ම ගු රි ස

(c) ධ නි ස ම, ම ගු, ගු ම ගු ස

(d) ස නි ස ම, ප ගු, ගු ම රි ස

(i) ඉහත ස්වර සංගතීන් අයත් වන රාග **හතර** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 08 යි.)

(ii) එම රාග අතුරෙන් එක ම මේලයකට අයත් රාග **දෙකක්** නම්කර, එම රාග දෙකට අයත් තොරතුරු **පහක්** සංසන්දනාත්මක ව ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) ඉතිරි රාග දෙකින් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ මධ්‍යලය වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාරකර, ඊට අදාළ මාත්‍රා **අටකට නො අඩු** තානාලංකාර **දෙකක්** ද තාලානුකූල ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

**2.**

| | රාගය | මේලය | අවරෝහණ | ජාතිය | අනුවාදී ස්වර | මුඛාංගය |
|---|---|---|---|---|---|---|
| (a) | **A** ...... | ඛමාජ් | සංනිධප, මග, රිගස | සම්පූර්ණ | **B** ...... | **C** ...... |
| (b) | **D** ...... | කාෆි | **E** ...... | ඖඩව | **F** ...... | **G** ...... |
| (c) | **H** ...... | බිලාවල් | සංනිධප, මග, රිස | **I** ...... | **J** ...... | නිස, ගමප, ගමග, රිස |
| (d) | **K** ...... | ඛමාජ් | සං, පධමග, සරිග, සනි | ෂාඩව සම්පූර්ණ | **L** ...... | **M** ...... |
| (e) | ජෞනපුරි | **N** ...... | සංනිධප, මගරිස | ෂාඩව සම්පූර්ණ | ස රි ම ප නි | මප, නිධප, ධ, මපග, රිමප |

(i) ඉහත වගුවෙහි **A** සිට **N** තෙක් ඇති හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ලකුණු 07 යි.)

(ii) පනිස්රිනිස් නිපමරි යනුවෙන් ස්වර සංගත වන (ඉහත වගුවෙහි ඇති) රාගයකට අදාළ මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ මධ්‍යලය වාදිතයක හෝ අන්තරා කොටස ස්වර ප්‍රස්තාරකර, මාත්‍රා **අටකට නො අඩු** තානාලංකාර **දෙකක්** ද තාලානුකූල ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) 'තිරිකිට' යන තාලාක්ෂරය දෙවරක් බැගින් යෙදෙන නිර්දේශිත තාල **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(iv) ඉහත (iii) හි නම් කරන ලද තාල දෙකෙහි සම විෂමතා **පහක්** සංසන්දනාත්මක ව ලියා දක්වන්න. (ලකුණු 05 යි.)

**3.** (i) ආවර්තයට හිමි මාත්‍රා සංඛ්‍යාව සමාන වුව ද එක් එක් විභාගය තුළ යෙදෙන මාත්‍රා සංඛ්‍යා අසමාන වන අවස්ථා ද ඇති නිර්දේශිත තාල **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉන් **එක්** තාලයක් සමගුණ වශයෙන් ද ඉතිරි තාලය දෙගුණ වශයෙන් ද තාල සංකේත සහිත ව පද ප්‍රස්තාරකර දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (i) යටතේ නම්කළ **එක්** තාලයක් තෝරාගෙන, එහි තාල ආවර්ත **දෙකක්** සම්පූර්ණ වන ලෙස හමීර් රාගයෙහි ආරෝහණ, අවරෝහණ ස්වර පිළිවෙළින් යෙදෙන පරිදි නිර්මාණාත්මක ව ගළපා ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි.)

(iv) එම තාල **දෙක** යොදා ගනු ලබන ගායන ශෛලීන් **දෙකක්** ඒ ඒ තාල නාම ඉදිරියෙන් ලියා දක්වා, ඉන් **එක්** ගායන ශෛලියක් පිළිබඳ කරුණු **පහක්** පෙළගස්වන්න. (ලකුණු 06 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

## II කොටස

**4.** A. ශ්‍රී ලාංකේය සංගීත ගමන් මගෙහි මහනුවර යුගය සඳහා හිමි වන විශේෂත්වය පහත සඳහන් මාතෘකා යටතේ විස්තර කරමින් සංගීත සඟරාවකට සුදුසු ලිපියක් සකස් කරන්න.

- දකුණු ඉන්දියානු බලපෑම
- සංස්කෘතික උත්සව
- රාජ සභා සංගීත හා නැටුම් ආයතන
- බිහි වූ දේශීය ගායනා විශේෂ
- යොදාගත් සංගීත භාණ්ඩ

(ලකුණු 10 යි.)

B. දේශීය රංග සම්ප්‍රදායන් තුනකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| (a) | තෝඩායම, ඉන්නිසය, පොතේ සින්දුව |
| (b) | මං ලෙස සොබනා, පෙර සිට පැවත එන, ගම්භීර කාලිංග නුවර |
| (c) | මනමේ, නරිබෑණා, සිංහබාහු |

(i) ඉහත වගුවේ එක් එක් ඉංග්‍රීසි අක්ෂර යටතේ ඇති තොරතුරුවලට අදාළ රංග සම්ප්‍රදායන් **තුන** නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉහත (b) තීරුව යටතේ ඇති රංග සම්ප්‍රදායෙහි සංගීතමය ලක්ෂණ **පහක්** ලියන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (c) තීරුව යටතේ ඇති රංග සම්ප්‍රදායට අයත් ඕනෑම ප්‍රචලිත ගීයක මුල් ගී පාදය තාලානුකූල ව පද ප්‍රස්තාර කරන්න. (විභාග අටක් සෑහේ.) (ලකුණු 02 යි.)

**5.** (i) සබරගමු වන්නම් පිළිබඳ කරුණු **හතරක්** පිළිබිඹු කරමින් උදාහරණ සහිත විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

(ii) පහතරට සින්දු වන්නම් පිළිබඳ කරුණු **හතරක්** යටතේ උදාහරණ සහිත විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) ටීකා සීපද කොටසක් උදාහරණයට ගනිමින් ටීකා සීපද පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 04 යි.)

(iv) සබරගමු වන්නමකට හෝ පහතරට සින්දු වන්නමකට හෝ අයත් ඕනෑම තානමක මුල් පාදය (විභාග අටක් සෑහේ.) සහ එම ගී වර්ග දෙකට අයත් ඕනෑම ගීතයක මුල් ගී පාදය (විභාග අටක් සෑහේ.) තාලානුකූල ව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

## III කොටස

**6.** එක් මාතෘකාවකට කරුණු **පහක්** ඇතුළත් වන සේ පහත සඳහන් මාතෘකා **හතරක්** පිළිබඳ උදාහරණ සහිත ව විස්තර කරන්න.

(i) වර්ණම් **හෝ** තිල්ලානා
(ii) රාගාශ්‍රිත සරල ගී
(iii) සම ප්‍රකෘති රාග
(iv) ගැමිලන් සංගීතය
(v) සංගීතඥ අමීර් කුශ්රූ
(vi) ඛ්‍යාල ගායනා ශෛලිය

(ලකුණු 05 × 4 = 20 යි.)

**7.**



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමය අනුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත ප්‍රස්තාරයට අදාළ කෝඩ්ස් (chords) පෙරදිග ප්‍රස්තාරය මත ඒ ඒ විභාගවලට අනුව පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(iii) එහි පළමු විභාග **හතර** මධ්‍යම භාවයෙන් පෙරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iv) අපරදිග සංධ්වනියක් යනු කුමක් දැ'යි හඳුන්වා, සංධ්වනියක සුවිශේෂ ලක්ෂණ **හතරක්** ලියා දක්වන්න. (ලකුණු 05 යි.)

(v) සංගීතඥ මෝසාට් (Mozart) පිළිබඳ සංගීතමය හා ජීවන තොරතුරු ඇතුළත් කරුණු **පහක්** ලියා දක්වන්න. (ලකුණු 05 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**8.** පෙරදිග සංගීත භාණ්ඩ කිහිපයකට අදාළ තොරතුරු සහිත වගුවක් පහත දැක්වේ.

| **භාණ්ඩයේ සැකසුම** | **වාදන විශේෂයකි** | **පර්දා ඇති/නැති බව** | **වැයීමේ ක්‍රමය** | **ඉන්දියානු වාදන ශිල්පියෙකි** | **භාණ්ඩයේ නම** |
|---|---|---|---|---|---|
| **A** ......... | ගත් වාදන | **B** ......... | උපාංගයක් නොමැතිව ඇතිල් | උස්තාද් අල්ලා රක්ඛා | **C** ......... |
| හමක් සහිත ය | **D** ......... | **E** ......... | 'ජවා' නමැති උපාංගයෙන් | **F** ......... | සරෝද් |
| හමක් රහිත ය | **G** ......... | පර්දා ඇත | **H** ......... | පණ්ඩිත් නිඛිල් බැනර්ජී | **I** ......... |
| හමක් රහිත ය | **J** ......... | පර්දා නැත | **K** ......... | **L** ......... | සන්තූර් |
| **M** ......... | ගායකී වාදන | පර්දා ඇත | **N** ......... | **O** ......... | **P** ......... |

(i) ඉහත වගුවෙහි **A** සිට **P** තෙක් ඇති හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ලකුණු 08 යි.)

(ii) වගුවෙහි **I** සහ **P** අක්ෂර දෙක සඳහා අදාළ වන සංගීත භාණ්ඩ දෙක අතර ඇති සමානතා **තුනක්** සහ අසමානතා **තුනක්** විස්තර කරමින් ලියා දක්වන්න. වගුවෙහි මුද්‍රිත තොරතුරු පිළිතුර සඳහා යොදා **නො ගන්න.** (ලකුණු 06 යි.)

(iii) නාදයෙහි ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka